# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2229/3 - 2021 මැයි මස 24 වැනි සඳුදා - 2021.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, "ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා ලිමිටඩ්" යන ආයතනය සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් මස 29 වැනි දින අංක 2051/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ පශ්චාත් නියමය මගින් සංශෝධිත 2014 ජුනි මස 16 වැනි දින අංක 1867/5 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමයට තවදුරටත් වූ වශයෙන් මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව 2020 මාර්තු මස 25 වැනි දින සිට තවදුරටත් වූ මාස දහනවයක (19) කාලසීමාවක් සඳහා දීර්ඝ කිරීම පිණිස 2017 දෙසැම්බර් මස 29 වැනි දින අංක 2051/38 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ පශ්චාත් නියමය මගින් සංශෝධිත 2014 ජුනි මස 16 වැනි දින අංක 1867/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ (4) වන වගන්තිය පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :

"(4) බස්නාහිර පළාතේ, අංක 418, 420 සහ 422, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03 යන ස්ථානයේ පිහිටි මහල් නිවාස සංකීර්ණයක් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය භාරගැනීම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතිය විසින්, ඉදිකිරීම් ආශ්‍රිත අයිතම සඳහා බදු නිදහස් පහසුකම් දීර්ඝ කිරීමෙන් තොරව, 2021 ඔක්තෝබර් මස 24 වැනි දින ස්වකීය මෙහෙයුම් වාණිජ කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය.

**මහින්ද රාජපක්ෂ, පා.ම.,**
මුදල් අමාත්‍ය.

2021 මැයි මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

06 - 195


1A - PG 5448 — 545 (2021/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*